## 4 වන වර්ෂය

# විෂය නිර්දේශය

## විෂය මාලාව

* අනිවාර්ය විෂයයන්

1. සිංහල
2. පාළි
3. සංස්කෘත
4. ත්‍රිපිටක ධර්මය
5. ඉංග්‍රීසි
6. ගණිතය

* වෛකල්පිත විෂයයන්

7. ඉතිහාසය
8. සෞඛ්‍ය විද්‍යාව
9. භූගෝල විද්‍යාව
10. සමාජ විද්‍යාව
11. සාමාන්‍ය විද්‍යාව
12. දෙමළ
13. හින්දි

(අනිවාර්ය විෂයයන් හය (6) ට අමතරව වෛකල්පිත විෂයයන් දෙකකට නොඅඩු ගණනක් ඉගැන්විය යුතු ය)

### 1. සිංහල (4 වර්ෂය)

1. අභිමතාර්ථ

1.1 ශ්‍රවණය කථනය කියවීම හා ලිවීම යන මූලික භාෂා හැකියාවන් වර්ධනය කිරීම.

1.2 ව්‍යාකරණය හා භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

1.3 ප්‍රකාශනය, ශක්තිය හා අර්ථ ග්‍රහණ ශක්තිය තීව්‍ර කිරීම.
1.4 භාෂා සාහිත්‍යාගත ඥාන සම්භාරය අත්පත් කර ගැනීමට පෙළඹවීම හා හුරු කිරීම.
1.5 සාහිත්‍ය රසාස්වාදයට හුරු කිරීම.

2. **විෂය කරුණු**

2.1 අක්ෂර මාලාව – අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ
2.2 සන්ධි – සන්ධි විධි හා සන්ධි ප්‍රභේද සවිස්තර ලෙස
2.3 නාම පද – ශබ්ද ප්‍රකෘති, නාම විභක්ති ප්‍රත්‍යය කාරකාර්ථ, සමාසනාම, තද්ධිතනාම, කෘදන්ත නාම.
2.4 අව්‍යය කෘදන්ත – පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපරක්‍රියා, ආවස්ථික ක්‍රියා.
2.5 ආඛ්‍යාත පද – ධාතු, ආඛ්‍යාත විභක්ති, ප්‍රත්‍යය, ආඛ්‍යාත ප්‍රභේද.
2.6 උක්තාඛ්‍යාත යෝගය – සාමාන්‍ය හා විශේෂ රීති.
2.7 රචනය
2.8 සාරාංශකරණය
2.9 ප්‍රායෝගික ලේඛන – ලිපි, දැන්වීම්, ඇරයුම්පත්, වාර්තා
2.10 රසාස්වාදය.
2.11 විචාර මූලධර්ම – සරල දැනීමක්

3. **නිර්දිෂ්ට ග්‍රන්ථ**

3.1 සිංහල 4 – (මූලික පිරිවෙන) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3.2 සංඝරාජ සාධුචර්යාව
3.3 ගුත්තිල කාව්‍යය – උදේනිපුර වර්ණනාවේ සිට
3.4 විජයබා කොල්ලය

## 2. පාලි (4 වර්ෂය)

1. **අභිමතාර්ථ**

1.1 ශ්‍රවණය, කථනය, කියවීම හා ලිවීම යන භාෂා හැකියාවන් වර්ධනය කිරීම
1.2 ව්‍යාකරණය හා භාෂා සම්ප්‍රදායන් හැඳින ගැනීම.
1.3 පරිවර්තන කෞශල්‍යය දියුණු කිරීම
1.4 පාළි භාෂා සාහිත්‍යාගත දර්ශනය හා චරණය අත්පත් කර ගැනීම
1.5 සාහිත්‍ය රසාස්වාදයට හුරුවීම